# අවසාන වාර පරීක්ෂණය - 2023
# සිංහල සාහිත්‍ය රසාස්වාදය
# 10 ශ්‍රේණිය
# පිළිතුරු පත්‍රය

**1.**

(i) (අ) කුරුණෑගල
(ආ) ප්‍රභාවතීට

(ii) (අ) වෙසන් පහන
(ආ) භික්කු සෑදීමේ කාර්යයේ (වෙසක් කූඩුවක් සෑදීමේ කාර්යයේ)

(iii) (අ) අලුත ගෙනා මනාලිය
(ආ) ජී. බී. සේනානායක

(iv) (අ) උතුරෙන්
(ආ) දහදිය හෙළමින් හිරිහැර ගැහැට විඳිමින් සිටින පිරිස් උතුර දකුණ භේදයකින් තොර ව සෑම තැනක ම සිටින බව

(v) (අ) **පසමිතුරු** - සතුරු **නිවතුන්** - දුප්පත්
(ආ) වනාන්තරයෙහි රෞද්‍ර වූ ගිනි කඳක් හට ගත් විට දිශා කෙළවරින් හමන්නා වූ මද සුළඟ ඒ ගින්න සමග මිශ්‍ර වේ.

**2.**

(i) බරණැස් නුවරට නුදුරු ගමක සහෝදරයාගේ නිවසේ

(ii) සහෝදරා හා ඔහුගේ බිරිඳ ඔවුන්ට අයත් කැවුම් කොටස අනුභව කොට තමාට අයිති කොටස පමණක් දන් දුන් නිසා

(iii) ස්ත්‍රියගේ මැණියන්ගේ ගෙට ගොස් සපුමල් පෙත්තක් සේ ඝන රන්වන් වූ අලුත් දැවූ ගිතෙල් පිරුණු පාත්‍රයක් පුරවා පූජා කොට ප්‍රාර්ථනාවන් (උපනුපන් ජාතියෙහි මාගේ ශරීරයෙන් ආලෝක පැතිරේවායි, උතුම් රූ ඇති වෙම්වායි හා අසත්පුරුෂයන් සමග වාසය නොකෙරේවා යැයි) කිරීම.

(iv) ස්ත්‍රිය අසත්පුරුෂයා සමග එක තැන වාසය නොකෙරේවා යනුවෙන් ප්‍රාර්ථනා කළ නිසා යොදුන් සියයක දුර සිටියත් මාගේ බලයෙන් මැය ගෙන්වා ගෙන මාගේ බිරිඳ බවට පත් කරගන්නට හැකි වේවා යනුවෙනි.

**නැතහොත්**

(i) අභිනවයෙන් විවාපත් වූ මනාලියකගේ ඇති කෝල බව විග්‍රහ කිරීම

(ii) සිහින් රත් පැහැති ඇඟිලි සහිත වීම. / සම ඉතාමත් පැහැපත් (රන්වන් පැහැ) වීම.

(iii) නිසඳැස් ආකෘතිය යොදා ගෙන තිබීමත්, ඒ සඳහා උදාහරණ දක්වා තිබීමත් ඇතුළු සමස්තය සලකා ලකුණු පිරිනමන්න.

(iv) සරල බස් වහර, සංක්ෂිප්ත බව, අනුප්‍රාසාත්මක බව ආදිය දක්වා ඇති පිළිතුරෙහි සමස්තය සලකා ලකුණු පිරිනමන්න.

## II පත්‍රය

- සියලු ප්‍රශ්න සඳහා දක්වා ඇති කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ගොඩ නගා ඇති සුදුසු පිළිතුරු සලකා ලකුණු ප්‍රදානය කරන්න.